## මිලාන මල් කැකුළ



නිර්භයා!
නුඹ වෙනුවෙන්
නුඹේ මුළු රටම
අවි අතට ගත්තේය...........
එහෙත්
සුනාමිය මගේ මව සොරා ගත්තාය
අසරණ මුවැත්තිය තනිවිය
පාදඩයන් රැලකට
මා ගොදුරක් විය
ඔවුන් මා බරු ගසමින්
කීතු කීතු කර
මගේ රුහිරු උරා බීවේය
එහෙත්
මහා කවියෝ ගීත ලීවේ නැත
මා වෙනුවෙන්
සප්ත ස්වර වැයුවේද නැත
හෙළයේ මහා කලාකරුවෝද
මුනිවත රකිති
මිලාන වූ මල් කැකුළ
ආශ්චර්යත් දේශයේ
දෙරණ සිපගෙන හමාරය........

එල්. ඩබ්. විමලා මිතසේන




ලොවක් වෙනුවෙන් රටක් වෙනුවෙන්
හැම දෙනා වෙත පා සෙනේ
විමුක්තිය මට ලබා දෙන්නයි
රුධිරයෙන් ඔබ නෑවුනේ
සතුට සොම්නස ඉවත දමමින්
පරදුවට දැමූ ජීවිතේ
සොයුරනේ ඔබ සිහි කරන්නයි
පිපුනෙ මල් හද කානතේ

වියරු අදිරද බලය බිඳුමට
කළේ මෙහෙවරයක් එදා
දිනන්ට රට සටන් කළෙ ඔබ
අවංකවමයි දිවි පුදා
සමරුවක් "ඉල්" වේද අමතක
සිහි කරමු බැතියෙන් මෙදා
අනේ සොයුරනි ඔබේ විරු නම
රැව් දිදී පැතිරෙයි සදා

කුරිරු ධනපති ඒකාධිපති
රජයකට වහලුන් වෙලා
කෙරෙන අගතිය දුටුව සොයුරනි
අහිංසක මිනිසුන් තලා
උන්ව ගොඩ ගත යුතුය කියලා
මිනිස් සංහතියම බලා
කෙරුන සටනින් පැරදුණත් ඔබ
ඔබට දල්වන්නෙමු නිලා

පිපුණ මල් පරවෙලා ගියමුත්
යළිත් එහි මල් පිපෙනවා
ඒ පිපුණ මල් සුවඳ පතුරා
යළි යළිත් එහි රැඳෙනවා
ජාති කුල මල බේද නොතකන
ලොවක් හෙට දින හැදෙනවා
වීර දොයුරන් සිහිකරන් ඒ
දිනයෙ රතු ධජ නැගෙනවා

මියුලා ආරියවතී
මුද්දරගම

## දුර

කොළොම්තොටඅහසට
සිහින්මීදුමවක්කර
නුඹටමාසිහිවෙනහැටි
බලාඉන්නෙමිදුරසිට

මේ එදා මීදුමමය
එදාහාදුත් නළලත
අපඅතරපමණයි
සත්සයුරු තරමට දුර

මලිති විජේසේකර




## යුගයක නිමාව

ප්‍රභාත් රණසිංහ



සාහිත විනිස අතැඹුල සේ දැන මතුර
අඳබල රටට මිණි පහනක් විය නිතර
බලු මුව බුරන හඬ පිරි රෑ වී කෙසර
ඇරැඹූ යුගය නම කෙරුවද මහ ඇදුර

හිස් පුස්තක ලියා කටමැත දොඩන
වියරණ අවුල් ඇදුරන් දුටුවිට කිපෙන
විකුමැති බාසුර ගමනක යළි නොඑන
කිසිදා නොවේ ඔබ ලියු කියු දේ පරණ

කටගැස්මට පිටකැස්මට ලියන එවුන්
ඔබේ ගෙයි දොරේ අඩයටවත් වටීද ඔවුන්
වැටුණු වළෙන් බස ගොඩගත් තනි ගිපිඳුන්
සරසවි දුවත් කැටුවම යනවද පඬිඳුන්

boondi.lk

## වියෝ වූ මිතුර

නො එන ගමනට දින නියමවුන
ගිලනුනට කැප රෝහලේ
වැතිර සයනේ සිත නිවා හල
මිතුර ඔබ සැතපුනිද නිවනේ

රුදුරු පිලිකාවට ගොදුරු වී
දැවී ඔද්දල් වී ගියද කය
දෙරණ මත මහ මෙර සිටි විලස
නොසැලි සිටියෙය සවිය ඔබ සිත

නෙත් උනා ගිය කඳුලු අතරින්
අස්වසා නෑ සියන් මිතුරන්
දුක් නොවන්නැයි සිනා මුහුනින්
දෙස් වදන් නොමැකේය සවනින්

ජීවිතේ නිමි වලලු අත හැර
එහා ලොව සුගතියට ගිය ඔබ
පියාපත් ලැබ ඉහල අහසට
පියාසර කල පරෙවියකු විය

එතෙර දුර කතර සිට
පැමිණියෙමු මේ බිමට
නොදැන මග තොට කිසිත්
නැතිව හඳුනන අයෙක්

හිරු බසින ඉසව්වෙන්
පැමිණියෙද ඔබ මෙතැන
හිරු නැගෙන ඉසව්වෙන්
පැමිණියෙද මා මෙතැන

මුන ගැසුන මොහොත සිට
ගොඩනැගුනි මිතුරු දම
කිසිවෙකුදු නැති තනිය
මග හැරුනි එක විගස

නොසමවිය අප පෙනුම
සම පැහැය ඉරියව්ව
බස වහර ගති සිරිත
ඇදහිල්ල දර්ශනය

ඒ නමුදු ඉව වැටුනි
හද රැඳුනු මිනිස්කම
සියලු බැමි ඉක්මවන
මිහි පතල සද්ගුණය

කාලයේ හෝරාව
ගෙවා දින සති වසර
පිය මං ව යන අයුර
බලා සිටියෙමු එකට

ගෙනා උරුමය රකින
දුවා දරු පිරිස අප
හැදී වැඩෙනා අයුර
බලා සිටියෙමු එකට

දුක සතුට එකතු කොට
බෙදා ගත් ජීවිතය
මතකයට ඉතිරි කොට
ඔබ ගියෙය අප අතැර

ප්‍රේමවංස දසනායක
ඇල්ටෝනා, වික්ටෝරියා.

# අලුත් පොත්




එල් මුරුගපූපති ගේ
## මතක සෙවණැලි

ශ්‍රී ලංකා භූමිය සලිත කළ යුද්ධයේ අත්දැකීම් අපි සිංහලෙන් අනන්තවත් කියවා ඇත්තෙමු. ඒ සියලු ලියවිලි සිංහලයින් විසින් ලියන ලද ඒවාය. වාර්ගික යුද්ධය දමිල පුරවැසියකුගේ ඇසින් දකින්නට අපට ඉඩ හසර ලැබී ඇත්තේ ඉතාමත් සීමා සහිතව ය. ඒ දෙමළ බසින් ලියවෙන් පොත පත සිංහලට පරිවර්තනය වන්නේ ඉතා කලාතුරකින් නිසා ය.



කලක් සහෝදරයින් මෙන් ජීවත් වූ මේ ජනවර්ග දෙක අතර විසල් පරතරයක් බිහි කරන්නට සමත් වූ වැදගත් කාරණයක් වූයේ එකිනෙකා තේරුම් ගන්නට නොහැකි තරමට භාෂාව විසින් ඈත් කරනු ලැබ තිබීම ය. මේ පරතරය අවම කිරීම සඳහා සාහිත්‍යයට කළ හැකි මෙහෙය අපමණ ය.

පසුගිය දා එළි දැක් වූ එල් මුරුගපූපති ගේ "මතක සෙවණැලි" කෘතිය හඳුන්වා දී ඇත්තේ "දෙමළ ඩයස්පෝරාවේ හදගැස්ම සිංහල පාඨකයා අතරට රැගෙන එන ප්‍රථම සාහිත්‍යමය අත්දැකීම" ලෙසින් ය. සිංහල දෙමළ සමගිය උදෙසා මහත් මෙහෙයක් කරමින් සිටින එල් මුරුගපූපති මහතා ගේ ෂැඩෝස් ඔෆ් මෙමොරීස් කෘතිය මතක සෙවණැලි නමින් සිංහලට පරිවර්තනය කර ඇත්තේ ඒ සී එම් කරාමත් මහතා ය. මේ වැදගත් කර්තව්‍යය වෙනුවෙන් ඒ දෙදෙනාම අපේ පැසසුමට ලක්වෙයි.

ඕස්ට්‍රේලියාවේ සිංහල සමාජය සමගින් සමීපව කටයුතු කරන මුරුගපූපති ජනවාර්ගික යුද්ධයේ සිය අත්දැකීම් ඇසුරෙන් ලියන ලද කෙටිකතා රැසක් මතක සෙවණැලි කෘතියේ අඩංගු වෙයි. ඒ අත්දෑකීම් වල නිර්ව්‍යාජ බව මේ කතා කියවන විට අපට දැනෙයි. කුරිරු යුද්ධය විසින් සහෝදර ජන වර්ග දෙකක් ඈත් කරන ලද ආකාරය මුරුගපූපති විස්තර කරන්නේ අප සිත කම්පා කරවමින් ය. මේ කුරිරු පරිසරය විසින් එකිනෙකා කෙරෙහි අවිශ්වාසය හා වෛරය ඇති කළ ආකාරය අපට වඩා හොඳින් විස්තර කරන්නට ඔහුට හැකි ය. ඒ ඔහු ඒ අත්දෑකීම් වලට සැබෑ ලෙසම මුහුණ දුන් නිසා ය.

ඔහු අපට සිතන්නට බොහෝ දේ ඉතිරි කරයි. දැන් සියල්ල හමාර යයි උදම් අනන ජාතියක් හමුවේ මේ සිත්නට ඉතිරි කර ඇති සියල්ල විසින් අපේ රටේ අනාගතය තීරණය කරනු ලබනු ඇතැයි අපට සිතෙයි.
අපට තවත් මුරුගපූපතිලා අවශ්‍ය ය.

ජගත් ජේ එදිරිසිංහ

16 වන පිටෙන්

අහිම්වෙනවා. බැරියර් දලා තියෙන්නේ. විශේෂයෙන්ම අපි අදින දේ පත්තරේ පලවෙන්නේ පත්තර අයිතිකාරයගේ දේශපාලන න්‍යාය පත්‍රයටත් ඒක ගැලපෙනවා නම් විතරයි. නැත්නම් ඒවා ප්‍රතික්ශේප කරනවා.

**කාටුන් ශිල්පියෙක් විදිහට ලබපු අමතක නොවන අත්දැකීම් මොනවද?**
මේක සිද්ධ වුණේ 1960 විතර මම කාටුන් අදින්න පටන් ගත්ත මුල් කාලෙදිමයි. පියසේන නිශ්ශංක මහත්තයා යුරෝපීය විදිහට අදින පළදින ගාම්භීර පෙනුමක් තියන කෙනෙක්. කොණ්ඩෙ සුදුයි. ටයි කෝට් ඇඳලා තමයි වැඩට එන්නේ. වෙනම පෙනුමක් තියනවා. දවසක් මම කාටුන් රූපයක් අදින වෙලාවෙදි මට පියසේන නිශ්ශංක මහත්තයාව මතක් වෙලා ශරීරය ඒ විදිහට ඇන්දා. කාටුන් එක ටිකක් හොදට ඇදුන නිසා මට හිතුණා නිශ්ශංක මහත්තයාගේ මූණම මේකට දාලා බලන්න ඕනේ කියලා. ඇඳලා බැලුවම ආව නිකන් පනපිටින් වගේ. මම මේක ගිහින් ඩී.එෆ්. කාරියකරවන මහත්තයාට පෙන්නුවා. මේ ආරංචිය පියසේන මහත්තයාගේ කණට ගිහිල්ලා මට කාමරයට කතා කළා. මම හිතුවා උපහාසයට ලක්කළා කියලා හොදටම තරහ ගිහින් ඇති කියලා. ඒත් එහෙම වුණේ නෑ. මට කතාකරල කිව්වා දක්ෂ කැමරා ශිල්පියෝ ගණනාවක් එයාගේ ෆොටෝ අරං තියනවා. ඒත් ඒ එක්කෙනෙක්වත් මේ වගේ එකක් අරං නෑ කියලා. මගෙන් කාටුන් එක ඉල්ලගෙන ඒ වෙලාවෙම කෙනෙක්ව පිටත් කළා ඒක රාමු කරගෙන එන්න. ඒ රාමු කිරිල්ල කොච්චර හොදට කළාද කියනවා නම් ඒ කාලෙත් රුපියල් දෙසිය පනහක් ඒකට ගිහිල්ලා තිබුණා. මේ සිදුවීමෙන් අවුරුදු තිහකට විතර පස්සේ පියසේන මහත්තයාගේ මළ ගෙදර මම ගියා. එදා මගෙන් අරගෙන රාමුකරගත්ත පින්තූරේ තමයි මිනිය ලඟින් තියලා තිබුණේ. වෙන කිසිම ෆොටෝ එකක් නෑ. පියසේන මහත්තයාගේ පුතා මට කිව්වා තාත්ත මේ පින්තූරෙට පනවගේ ආදරේ කළ කියලා.

**මේ වෙනකොට කොහොමද ඔබේ කළ දවස ගතවෙන්නේ?**
වැඩිපුරම ගෙදරට වෙලා තමයි ඉන්නේ. මගේ මේ කකුලක ආබාධයක් ඇවිල්ලා ඇවිදින්න ටිකක් අමාරුයි. උදේ වරුවේ ලංකාදීප පත්තරේට කාටුන් ටික අදිනවා. ඒ අතරේ මගේ කාටුන් එකතුවක් පොතක් හැටියට ප්‍රකාශයට පත්කරන්න ලෑස්ති කරමින් ඉන්නවා. දැන් ඒකේ වැඩ ගොඩක් දුරට ඉවරයි. පත්තරවලට ඇදපු, පලවෙච්ච සහ ප්‍රතික්ශේප වෙච්ච කාටුන් මේ පොතට ඇතුළත් කරලා තියනවා.